සවියෙන් පෙරට - අපි එකට

e–ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | භූගෝල විද්‍යාව | 1 | 1. ආසියානු ප්‍රදේශය |



සැකසුම:- එල්. පී. හංසිකා


බප/හො/ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය, අරුග්ගොඩ

# හැඳින්වීම

- පෘථිවි ගෝලය තුළ විශාල ගොඩබිම් (මහාද්වීප) 7ක් ඇත.
- ඒවා අතරින් විශාලතම ගොඩබිම් කොටස ආසියාවට අයත් වේ.
- අප ජීවත්වන ශ්‍රී ලංකාව මෙම මහාද්වීපයේ පිහිටා තිබීම නිසා ආසියා මහාද්වීපය, එහි සුවිශේෂ ලක්ෂණ පිළිගැනීම අපට වැදගත්ය.

# ආසියාවේ භූගෝලීය පිහිටීම

❖ *සාපේක්ෂ පිහිටීම*



# නිරපේක්ෂ පිහිටීම

- ආසියා මහාද්වීපය දකුණු අක්ෂාංශ $10^0$ සිට උතුරු අක්ෂාංශ $80^0$ අතර

- නැගෙනහිර දේශාංශ $25^0$ සිට $180^0$ අතරය.

<u>ආසියාවට අයත් ගොඩබිම් රටවල්</u>

- ඉන්දියාව
- පකිස්ථානය
- භූතානය
- නේපාලය

<u>දූපත් රටවල්</u>

- ශ්‍රී ලංකාව
- මාලදිවයින
- පිලිපීනය
- තායිවානය

# යුරේසියාව යනු කුමක්ද?

යුරෝපය හා ආසියාව භූගෝලීය වශයෙන් එක් භූමි ස්කන්ධයක් ලෙස පිහිටා ඇති අතර යුරෝපය සහ ආසියාව එක්ව සලකා යුරේසියාව ලෙස හැඳින්වේ.

# ආසියාව යුරෝපයෙන් හා අප්‍රිකාවෙන් වෙන්වන මායිම්

- යූරල් කඳුවැටිය
- යූරල් ගඟ
- කැස්පියන් මුහුද
- කොකේසස් කඳු
- කළු මුහුද
- මධ්‍යධරණී මුහුද
- සූවස් ඇළ
- රතු මුහුද

# ආසියා මහාද්වීපයට අයත් දූපත්

**<u>විශාල දූපත්</u>**

- ජපන් දූපත්
- ඉන්දුනීසියානු දූපත්
- පිලිපීන් දූපත්
- ශ්‍රී ලංකාව
- තායිවානය

**<u>කුඩා දූපත්</u>**

- අන්දමන්
- නිකොබාර්
- මාලදිවයින

# ආසියානු ප්‍රදේශයේ සුවිශේෂත්වය

**භෞතික හා මානුෂ වශයෙන් සුවිශේෂී ලක්ෂණ**

- විශාලතම මහාද්වීපය වීම
- සියලුම දේශගුණ වර්ග දක්නට ලැබීම
- මානව වර්ග , ජන වර්ග , භාෂා හා සංස්කෘතික විවිධත්වය
- ප්‍රධාන ආගම් රැසක නිජබිම වීම
- ලෝකයේ විශාලතම කඳු පද්ධතිය සහ වඩාත් උසම කඳු ශිඛර පිහිටා තිබීම

# ආසියාව පිළිබඳ වැදගත් තොරතුරු

- විශාලත්වය වර්ග කිලෝමීටර මිලියන 44.6 ක් පමණ වේ.
- මුළු ගොඩබිම් ප්‍රමාණය 30% පමණ වේ.
- සමස්ත පෘථිවි තලයෙන් 8.7% කි.
- ලෝකයේ විශාලතම කඳු පද්ධතිය වන හිමාලය පිහිටා තිබීම.
- ලෝකයේ උසම කඳු ශිඛර වන එවරස්ට් පිහිටා තිබීම.
- මුහුදු මට්ටමට වඩා පහළින් පිහිටි මළ මුහුද පිහිටා තිබීම.
- ලෝකයේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන ඉන්දියාවේ මේගාලයා ප්‍රාන්තයේ පිහිටි චෙරාපුංජි ප්‍රදේශය පිහිටා තිබීම.
- වර්ෂාපතනය අඩුවෙන් ලැබෙන ගෝබි කාන්තාරය පිහිටා තිබීම.
- ශාක හා සත්ව විවිධත්වය හෙවත් ජෛව විවිධත්වය ඉතා ඉහළ වීම.
- ලෝකයේ ජනගහනයෙන් 60% ආසියාවේ වාසය කිරීම.

- ලෝකයේ වැඩිම ජන සංඛ්‍යාවක් ඇති රටවල් 10න් 6ක් ආසියාවේ පිහිටා තිබීම.
    - චීනය
    - ඉන්දියාව
    - ඉන්දුනීසියාව
    - පකිස්ථානය
    - බංගලාදේශය
    - ජපානය

- ආසියාවේ සාමාන්‍ය ජන ඝනත්වය 8.7 $km^2$
- විවිධ ජන වර්ග වාසය කරන බැවින් විවිධ භාෂාවන් පැවතීම. (උදා - චීනයේ භාෂා 297ක් පැවතීම)
- විවිධ ආගම් අදහන ජනතාව වාසය කිරීම.

(උදා - බෞද්ධ ධර්මය , හින්දු ධර්මය , ඉස්ලාම් ධර්මය , කතෝලික ධර්මය)

- ලොව ඉපැරණි ශිෂ්ටාචාර බිහි වූ ප්‍රදේශයක් වීම.
    - මෙසපොතේනියානු ශිෂ්ටාචාරය
    - හොවැංහෝ ශිෂ්ටාචාරය
    - ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

# ආසියාවේ භූ දර්ශන

| භෞතික භූ දර්ශන | මානුෂ භූ දර්ශන |
| --- | --- |
| • භූ විෂමතාව | • පැරණි මානව ශිෂ්ටාචාර |
| • ජලවහනය | • ජන ව්‍යාප්තිය |
| • දේශගුණය | • මානව වර්ග |
| • වෘක්ෂලතා හා වන ජීවීන් | • ආර්ථික ක්‍රියාකාරකම් |

# භූ විෂමතාවය යනු

- භූමිය මත පවත්නා විවිධ ලක්ෂණයන්ය.

  උදා - කඳු , කඳු පන්ති , සානු , තැනිතලා

## ආසියානු ප්‍රදේශයේ කැපී පෙනෙන භූ ලක්ෂණය

## හිමාලය කඳු පන්තිය

- හිමාලය කඳුවැටියේ දිග - 2500km
- භූමි ප්‍රමාණය - වර්ග කිලෝමීටර 6,12,000
- හිමාලය කඳුවැටියේ විශේෂත්වය
  - ඉන්දියාව උතුරු ඉන්දියාව සහ දකුණු ඉන්දියාව ලෙස වෙන්වීම.
  - ඉන්දියාව ආසියාවෙන් වෙන් වී පෙනීම.

# හිමාලය කඳු පන්තිය තුළ පිහිටි වඩාත් උස කඳු ශිඛර

| කඳු ශිකර | උස(මීටර්) |
|---|---|
| එවරස්ට් | 8848 |
| කන්චිජුන්ගා | 8586 |
| මකාලු | 8462 |
| ධවලගිරි | 8167 |
| මනස්ලු | 8156 |
| නන්ගා පාබට් | 8126 |
| අන්නපූර්ණා | 8091 |
| නන්දා දේවි | 7817 |

# ආසියාවේ පිහිටා ඇති සානු

- ටිබෙට් සානුව (ලෝකයේ පියස්ස)

  * වඩාත් උසින් පිහිටීමත් විශාල ප්‍රදේශයක පැතිරී යාමත් නිසා මෙලෙස හඳුන්වයි.

- පාමීර් සානුව
- ඩෙකැන් සානුව
- මධ්‍යම සයිබීරියානු සානුව
- ඉරාන සානුව

# ආසියාවේ ඇති තැනිතලා

- බටහිර සයිබීරියානු තැන්න
- මැන්චූරියානු තැන්න
- චීන මහා තැන්න

# ❖ ජල වහනය

ආසියානු ප්‍රදේශය පුරා පැතිරුනු විශාල ගංගා පද්ධති රාශියක් පිහිටා ඇත.

<u>ගංගාවේ නම</u> <u>ගලා බසින සාගරය</u>

- ඔබි, යෙනිසි , ලීනා → ආක්ටික් සාගරය
- අමූර් , හොවැංහෝ , යැංසි → පැසිපික් සාගරය
- ගංගා , ඉන්දු , බ්‍රහ්මපුත්‍ර , මීකොං , ඉරවඩි , සැල්වීන් → ඉන්දියන් සාගරය
- යුප්‍රටීස් , ටයිග්‍රීස් → පර්සියන් බොක්ක

<u>අභ්‍යන්තර මුහුදට ගලා බහින ගංගා</u>

- සර්ඩේරියා , අමුඩේරියා → ඒරල් මුහුද
- යූරල් → කැස්පියන් මුහුද


# ආසියාවේ ප්‍රධාන ගංගා

| ගංගාව | දිග (km) |
|---|---|
| යැංසි | 6301 |
| හොවැංහෝ (කහ) | 5464 |
| මීකොං | 4909 |
| ලීනා | 4400 |
| යෙනිසි | 4088 |
| ඔබි | 3650 |
| ඉන්දු | 2900 |
| බ්‍රහ්මපුත්‍ර | 2897 |
| ගංගා | 2510 |

## ප්‍රධාන විල්

- බයිකල් විල ( ලෝකේ ගැඹුරුම මිරිදිය විල)
- බොල්කැෂ් විල

# ආසියාවේ ගංගාවන්ගේ දිග ලංකාවේ දිග සහ පළල සමඟ සැසඳීම




1.2 සිතියම - ශ්‍රී ලංකාවේ විශාලත්වය

## දේශගුණය

සමකයේ සිට උත්තර ධ්‍රැවය සහ දක්ෂිණ ධ්‍රැවය දක්වා උෂ්ණත්වය ව්‍යාප්තියේ පවතින වෙනස්කම් මත පෘථිවිය ප්‍රධාන දේශගුණික කලාප තුනකට බෙදා ඇත.

- ❖ නිවර්තන කලාපය
- ❖ සෞම්‍ය කලාපය
- ❖ ශීත කලාපය




1.3 සිතියම - ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාප ව්‍යාප්තිය

# ප්‍රධාන දේශගුණ කලාප තුනෙහි කැපී පෙනෙන ලක්ෂණ

| කලාපය | ලක්ෂණ |
|---|---|
| **නිවර්තන කලාපය (උණුසුම් දේශගුණය** | ඉතා ඉහළ උෂ්ණත්වයක් පවතීම ($18^0$C වැඩි) |
| **සෞම්‍ය කලාපය (සෞම්‍ය දේශගුණය)** | නිවර්තන කලාපයට වඩා උණුසුම අඩුය, වසර පුරා උණුසුම අඩු වැඩි වේ. පැහැදිලි ඍතු භේදයක් ඇත. |
| **ශීත කලාපය (ශීත දේශගුණය)** | උෂ්ණත්වය ඉතා පහළය. වැඩිකාලයක් හිම පතනය වේ. |

# ආසියා මහාද්වීපයේ දක්නට ලැබෙන දේශගුණ වර්ග

| දේශගුණික කලාපය | දේශගුණ වර්ග | පැතිරී පවතින රටවල්/ප්‍රදේශ |
|---|---|---|
| **නිවර්තන** | නිවර්තන වර්ෂා දේශගුණය | ජාවා, සුමාත්‍රා දූපත් |
| | නිවර්තන මෝසම් දේශගුණය | ඉන්දියාව, ශ්‍රී ලංකාව,මියන්මාරය |
| | නිවර්තන සැවානා දේශගුණය | උතුරු ඉන්දියාවේ ඊසානදිග කොටස,බංග්ලාදේශය |
| | උෂ්ණ කාන්තාර දේශගුණය | තාර් කාන්තාරය මැද පෙරදිග රටවල් |
| **සෞම්‍ය** | උණුසුම් සෞම්‍ය දේශගුණය | මධ්‍යධරණී මුහුද අවට ප්‍රදේශ |
| | තෙත් සෞම්‍ය දේශගුණය | නැගෙනහිර චීනය, ජපන් දූපත් |
| **ශීත** | ධ්‍රැව සහ තුන්ද්‍රා දේශගුණය | සයිබීරියානු කලාපය සහ ආසියාවේ උතුරු කොටස් |
| | කඳුකර දේශගුණය | හිමාලය කඳු ආශ්‍රිත ප්‍රදේශ |

# ආසියානු කලාපයේ උපදේශගුණ වර්ග බිහිවීමට බලපාන සාධක

- සාගරයේ පිහිටීම
- මහාද්වීපික පිහිටීම
- කඳුපද්ධතිවල පිහිටීම
- මුහුදු මට්ටමේ සිට උස
- වර්ෂාපතනයේ වෙනස්කම්
- මෝසම් සුළං බලපෑම

ආසියාවේ වැඩිම උෂ්ණත්වය ඇති නගරය → පාකිස්ථානයේ ජකෝබාබාද් නගරය

ආසියාවේ අඩුම උෂ්ණත්වය ඇති නගරය → රුසියාවේ වර්කොයැන්ස්ක් නගරය

# වෘක්ෂලතා හා වන ජීවීන්

## එක් එක් දේශගුණ වර්ගයන්ට අනුව ස්වභාවික වෘක්ෂලතා සහ වන ජීවීන් හැඩගැසී ඇත

| දේශගුණ කලාපය | ශාක විශේෂ | සත්ත්ව විශේෂ | කැපී පෙනෙන ලක්ෂණ |
|---|---|---|---|
| නිවර්තන කලාපය (නිවර්තන වර්ෂා වනාන්තර) | මහෝගනී, එබොනි, රෝස්වුඩ්, කළුවර, උණ වර්ග, හඳුන්, ඇකේෂියා, වැල් වර්ග, පෙඳ, පාසි, අපිශාක | වඳුරු විශේෂ, උරග වර්ග, සර්ප විශේෂ, මත්ස්‍ය විශේෂ, කටුසු විශේෂ, කොටියා, දිවියා, වලසා, ඌරා, නරියා, මුවා, ගෝනා | ➢ ඉහළ උෂ්ණත්වයක් තිබීම<br>➢ සදාහරිත වනාන්තර තිබීම<br>➢ ශාක වේගයෙන් වැඩේ<br>➢ ජෛව විවිධත්වය අධිකය |
| සෞම්‍ය කලාපය (පතනශීලී වනාන්තර) | ඕක්, මල්බෙරි, චෙස්නට්, පයින්, යුකැලිප්ටස්, ඩග්ලස්ෆර් | වෘකයා, වලසා, ගෝනා, මුවා, ඇන්ටිලොප් | ➢ පතනශීලී වනාන්තර පවතී<br>➢ වාර්ෂිකවපත්‍ර හැලීම සිදුවේ |
| ශීත කලාපය ( කේතුධර වනාන්තර) | පයින් වර්ග, ස්පෘස්, ෆර්, ඕක්, ලාච් | පිනිමුවා, හිමවලසා, හිම බල්ලා,සේබල්, මින්ක් | ➢ දිග ශීත ඍතුවක් පවතී<br>➢ ශාක කේතු රූපාකාර හැඩයක් ගනී<br>➢ ශාකපත්‍ර ඉදිකටු තුඩු වැනි හැඩයක් ගනී |



නෙරූ ස්තරය
වියන් ස්තරය
උප වියන් ස්තරය
යටි වගාව
බිම් ස්තරය
Leemo WILD






# සදාහරිත වනාන්තර



# පතනශීලී වනාන්තර



# කේතුධර වනාන්තර





# නිවර්තන වනාන්තර











# සෞම්‍ය කලාපීය වනාන්තර








# ආසියාවේ මානුෂ භූ දර්ශනය

- ආසියාවේ මානුෂ කටයුතු පිළිබඳ මෙහිදී සලකා බලයි.
- පැරණි මානව ශිෂ්ටාචාර

01. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

02. හොවැංහෝ ශිෂ්ටාචාරය (චීන ශිෂ්ටාචාරය)

03. යුප්‍රටීස් - ටයිග්‍රීස් (මෙසොපොටේමියානු ශිෂ්ටාචාරය)

නයිල් නිම්න ශිෂ්ටාචාරය ද ගංගා නිම්න ශිෂ්ටාචාරයක් වුවත් එය පිහිටා ඇත්තේ අප්‍රිකා මහද්වීපයේය.

# ආසියාවේ ජීවත්වන මානව වර්ග

| | |
|---|---|
| මොන්ගොලොයිඩ් | කොකසොයිඩ් |
| චීනය | ඉන්දියාව |
| ජපානය | ඇෆ්ගනිස්ථානය |
| මලයාසියාව | පාකිස්ථානය |
| කොරියාව | ශ්‍රී ලංකාව |
| සිංගප්පූරුව | අරාබි රටවල් |

# ආසියානු කලාපය

- වර්තමාන ජන සංඛ්‍යාව - මිලියන 4460 ක් පමණ'
- ජන හිත ප්‍රදේශ - මධ්‍යම ආසියාව, මොංගෝලියාව,

  උතුරු දිග තැනිබිම් ප්‍රදේශ, ගෝබි සහ ථාර් කාන්තාර
- ජන ඝනත්වය අධික ප්‍රදේශ -

  - උතුරු ඉන්දියාවේ ඉන්දු ගංගා තැන්න ආශ්‍රිත කලාපය
  - මියැන්මාරයේ ඉරවඩි ගංගා නිම්න ආශ්‍රිත කලාපය
  - චීනයේ හොවැංහෝ නිම්න ආශ්‍රිත කලාපය

## ආසියාවේ ජනාධික රටවල්

* චීනය (මිලියන 1370)
* ඉන්දියාව (මිලියන 1299)
* ඉන්දුනීසියාව (මිලියන 255)
* පාකිස්ථානය
* බංගලාදේශය
* ජපානය

## ජන සංඛ්‍යාව අඩු රටවල්

* මාලදිවයින (34500)
* බෲනායි (421000)
* මැකාවෝ (641000)
* භූතානය
* ටිමෝර්
* බහරේන්

# ආර්ථික ක්‍රියාකාරකම්

ආසියානු කලාපයේ රටවල විවිධ ආර්ථික ක්‍රියාකාරකම් දක්නට ලැබේ.

1. කෘෂිකාර්මික
2. කාර්මික
3. සේවා

# කෘෂිකාර්මික රටක් ලෙස පාකිස්ථානය

- රටේ දළ දේශිය නිෂ්පාදනයෙන් 25.9% ක් කෘෂි අංශයෙන් ලැබේ.
- මුළු ශ්‍රමිකයන්ගෙන් 43% ක් කෘෂි අංශයේ කටයුතුවල නිරත වේ.
- රටේ මුළු භූමියෙන් 25% ක් කෘෂිකාර්මික කටයුතු සිදු කරයි.
- කපු ප්‍රධාන බෝගය වේ.
- පාකිස්ථානය ලෝකයේ විශාලතම වාරි මාර්ග පද්ධතිය සහිත රට නිසා කෘෂි බිම් වලට ජලය සපයා දීම සිදුවේ‘

පාකිස්ථානයේ ප්‍රධාන වගා කන්න

| වගා කන්නය | බලපැවැත්වෙන කාල සීාව | වගා කරන බෝග |
|---|---|---|
| **කාරිෆ්** | අප්‍රේල් සිට ඔක්තෝම්බර් | කපු, වී, මිලට්, මේස්, උක් |
| **රාබි** | නොවැම්බර් සිට මාර්තු | තිරිඟු, බාර්ලි, ඕට්ස් |

# පාකිස්ථානයේ ප්‍රධාන කෘෂි බෝග

තිරිඟු, සහල්, උක්, අඹ, චික් පී, එළවළු, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන, ගව මස්, එළු මස්, බිත්තර

**කෘෂි නිෂ්පාදන ලෝක වෙළඳපොළට සැපයීම අතින් පාකිස්ථානය හිමිකරගෙන ඇති ස්ථානය**

| නිෂ්පාදන වර්ගය | ලෝක වෙළඳාම් තුළ හිමි ස්ථානය |
|---|---|
| චික් පී | 3 |
| ඇප්‍රිකට් | 6 |
| කපු | 4 |
| උක් | 5 |
| කිරි නිෂ්පාදන | 5 |
| තිරිඟු | 7 |
| සහල් | 4 |
| අඹ | 4 |

# කාර්මික රටක් ලෙස ජපානය

- ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය අනුව ලෝකයේ තුන්වන විශාලතම ආර්ථිකය වේ
- දළ ජාතික නිෂ්පාදනයෙන් 27.5% ක් කර්මාන්ත අංශය හිමිකරගෙන ඇත
- ශ්‍රම බලකායෙන් 26.2% ක් කාර්මික අංශයේ රැකියාවල නිරත වේ
- ජපානයේ ප්‍රධාන කාර්මික නිෂ්පාදන - මෝටර් රථ, විදුලි උපකරණ, යන්ත්‍රෝපකරණ, යකඩ සහ වානේ, නැව්, රසායන ද්‍රව්‍ය, රෙදිපිළි, පරිගණක උපාංග, රොබෝ තාක්ෂණය, ඖෂධ, සැකසූ ආහාර
- ජෛව තාක්ෂණය දියුණු මට්ටමක පැවතීම
- පරමාණුක බලශක්තිය බහුලව භාවිත කිරීම.

| ජපානයේ මෝටර් රථ නිෂ්පාදන සමාගම් | ඉලෙක්ට්‍රොනික් හා විදුලි උපකරණ සමාගම් | පරිගණක හා පරිගණක උපාංග සමාගම් |
|---|---|---|
| ටොයෝටා | සෝනි | නෙක් |
| නිසාන් | මිට්සුබිෂි | ෆුජිට්සු |
| මැස්ඩා | ඉලෙක්ට්‍රික් | සීකෝ |
| ඩයිහට්සු | පැනසොනික් | එප්සන් |
| මිට්ෂුබිසි | කැනන් | අයි.බී.එම් |
| සුබාරු | ෆුජිට්සු | ජපෑන් |
| හීනෝ | නිකොන් | |
| හොණ්ඩා | යමහා | |
| යමහා | ෂාප් | |
| සුසුකි | නෙක් | |
| කවසාකි | හිටාචි | |
| | කැෂියෝ | |

# සේවා මධ්‍යස්ථානයක් ලෙස ඩුබායි රාජ්‍යයේ වැදගත්කම

- ඩුබායි එමිරේටස් රාජ්‍ය 7 න් 1 කි.
- ඩුබායි වර්ග කිලෝමීටර් 3885 ක් තරම් කුඩා රාජ්‍යයකි.
- ජන සංඛ්‍යාව 2502715.
- ජන ඝනත්වය වර්ග කිලෝමීටරයට 644.2 කි.
- ඉතා ජනාකීර්ණ රටකි.
- මැද පෙරදිග කලාපයේ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානයයි.
- ආර්ථිකයේ පදනම පෙට්‍රෝලියම් නිෂ්පාදනයයි.
- කෘෂිකාර්මික කටයුතු සඳහා සුදුසු බිමක් නොවේ.
- ඩුබායි ආර්ථිකයේ ප්‍රධාන අංශය සේවා අංශයයි.
  - සේවා අංශයේ දායකත්වය මුළු දළ දේශීය නිෂ්පාදිතයෙන් 37.2% කි.
  - රැකියා නියුක්තිකයන්ගෙන් 33% ක් සේවා අංශයේ නිරත වේ.

# සේවා මධ්‍යස්ථානයක් ලෙස ඩුබායි රාජ්‍යයේ වැදගත්කම

- ලෝකයේ පෙර-අපර දෙදිග සම්බන්ධ වන ගුවන් ගමන් මධ්‍යස්ථානයක් වීම.
- මැද පෙරදිග ප්‍රධාන අපනයන මධ්‍යස්ථානය වන ජෙබිල් අලි වරාය වැදගත් වීම.
- සංචාරක ආකර්ෂණය හා සංචාරක සේවාවන් රැසක් සපයන සේවා මධ්‍යස්ථානයක් වීම.
- ජාත්‍යන්තර සන්නිවේදන සේවා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

    උදා :- CNN, Al Jazeera

- ක්‍රිකට් සහ ටෙනිස් ක්‍රීඩාව සඳහා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරග සඳහා ක්‍රීඩාංගණ පහසුකම් සපයන ක්‍රීඩා මධ්‍යස්ථානයක් වීම.
- "Dubai Mall" නම් වූ ලෝකයේ විශාලතම වෙළඳ මධ්‍යස්ථානය පිහිටුවා තිබීම.

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | භූගෝල විද්‍යාව | 1 | 1. ආසියානු ප්‍රදේශය - ඇගයීම |

**සැකසුම:- එල්. පී. හංසිකා**
**බප/හො/ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය, අරුග්ගොඩ**


01. ආසියාවේ සාපේක්ෂ පිහිටීමට අදාළ භූගෝලීය මායිම් ලෝක සිතියමක ලකුණු කරන්න.
02. නිරපේක්ෂ පිහිටීමට අදාළ අක්ෂාංශ හා දේශාංශ එහි ලකුණු කරන්න.
03. ආසියානු ප්‍රදේශයට අයත් භූ ස්කන්ධය සේයා කර දක්වන්න.
04. කහ ගඟ යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන්නේ කුමන ගඟද? එය පිහිටි රට කුමක්ද?
05. ලෝකයේ ජනාධිකම රට කුමක්ද?
06. ආසියා මහද්වීපයේ සුවිශේෂී ලක්ෂණ 3 ක් ලියන්න.
07. ආසියා මහද්වීපයේ උතුරු, දකුණ, නැගෙනහිර සහ බටහිරින් මායිම් වන්නේ කෙසේද?
08. ආසියා මහද්වීපයේ නිවර්තන දේශගුණික කලාපය තුළ පැතිරී ඇති අනු දේශගුණික වර්ග මොනවාද?
09. මහද්වීපයේ පැතිර පවතින වනාන්තර වර්ග කොට ඒවායේ ජීවත් වන සත්ත්ව විශේෂ සහ ශාක විශේෂ දෙක බැගින් ලියන්න.
10. ආසියාවේ ජන සංඛ්‍යාව කලාපීය වශයෙන් මෙන්ම රටවල් වශයෙන් අසමානව ව්‍යාප්ත වීමට බලපෑ ඇති හේතු මොනවාද?
11. ආසියාවේ ප්‍රධාන කාර්මික රටවල් 5 ක් නම් කරන්න.

# සවියෙන් පෙරට අපි එකට
# *e*- ඉගෙනුම් පාසල
# හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | භූගෝල විද්‍යාව | 1 | 1. ආසියානු ප්‍රදේශය - පිළිතුරු |

**සැකසුම:- එල්. පී. හංසිකා**
**බප/හො/ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය, අරුග්ගොඩ**

01.



02. 03.



04. හොවැංහෝ, චීනය

05. චීනය

06. විශාලතම මහද්වීපය වීම, සියලුම දේශගුණ වර්ග දක්නට ලැබීම, මානව වර්ග, ජන වර්ග, භාෂා හා සංස්කෘතික විවිධත්වය, ප්‍රධාන ආගම් රැසක නිජබිම වීම, ලෝකයේ විශාලතම කඳු පද්ධතිය සහ වඩාත් උසම කඳු ශිඛර පිහිටා තිබීම.

07.

උතුර

(ආක්ටික් සාගරය)

| | | |
|---|---|---|
| බටහිර | ආසියාව | නැගෙනහිර |
| (යුරෝපා මහාද්වීපය) | | (පැසිපික් සාගරය) |

දකුණ

(ඉන්දියන් සාගරය, ඇන්ටාක්ටිකා මහාද්වීපය)

08. නිවර්තන වර්ෂා දේශගුණය, නිවර්තන මෝසම් දේශගුණය, නිවර්තන සැවානා දේශගුණය, උෂ්ණ කාන්තාර දේශගුණය

09.

| | | |
|---|---|---|
| නිවර්තන වර්ෂා වනාන්තර | මහෝගනී, එබොනි, රෝස්වුඩ්, කළුවර, උණ වර්ග, හඳුන්, ඇකේෂියා, වැල් වර්ග, පෙඳ, පාසි, අපිශාක | වඳුරු විශේෂ, උරග වර්ග, සර්ප විශේෂ, මත්ස්‍ය විශේෂ, කටුසු විශේෂ, කොටියා, දිවියා, වලසා, ඌරා, නරියා, මුවා, ගෝනා |
| පතනශීලී වනාන්තර | ඕක්, මල්බෙරි, චෙස්නට්, පයින්, යුකැලිප්ටස්, ඩග්ලස්ෆර් | වෘකයා, වලසා, ගෝනා, මුවා, ඇන්ටිලොප් |
| කේතුධර වනාන්තර | පයින් වර්ග, ස්පෲස්, ෆර්, ඕක්, ලාච් | පිනිමුවා, හිමවලසා, හිම බල්ලා,සේබල්, මින්ක් |

10.

- විශාලතම මහාද්වීපය වීම
- සියලුම දේශගුණ වර්ග දක්නට ලැබීම
- කාර්මීකරණය වේගවත් වීම
- විවිධ ජාතීන් හා ආගම් ව්‍යාප්තව තිබීම
- සංවර්ධිත රටවල්වල සෞඛ්‍ය පහසුකම් දියුණු වීම

11. චීනය, ඉන්දියාව, ජපානය, කොරියාව, රුසියාව